AAT Level – 01

# ECONOMICS
# (ECN)

# නිෂ්පාදන ක්‍රියාවලියේ හැසිරීම
# හා
# විවිධ වෙළඳපොළ ව්‍යූහයන්

## Tute – 03

Prepared by - Chinthaka Kelum Udayasiri
BBA (SP) Mgt (University of Colombo)
Gold medalist (University of Colombo)
CIM (UK) Passed Finalist
AAT Passed Finalist
Dip in Strategic Brand Management (SLIM)
Dip in Digital Marketing (APIDM)

JMC vLearning "your virtual learning partner"

## අන්තර්ගතය


- ගිණුම්කරණ පිරිවැය හා ආර්ථික පිරිවැය
- කෙටි කාලය හා දිගු කාලය
- කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය
- කෙටි කාලීන නිෂ්පාදන පිරිවැය සංකල්ප
- හීනවන ඵලදා නීතිය
- දිගුකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය
- පරිමාණානුකූල ඵල නීතිය
- වෙළඳපොළ ව්‍යූහයන් වල ලක්ෂණ
- නිශ්ප්‍රාමාණික ලාභ, ප්‍රාමාණික ලාභ හා අවප්‍රාමාණික ලාභ ලැබීම


## ගිණුම්කරණ පිරිවැය හා ආර්ථික පිරිවැය

### නිෂ්පාදන පිරිවැය

ආර්ථික විද්‍යාවේදී නිෂ්පාදන පිරිවැය යන්නෙන් අදහස් කරනුයේ නිෂ්පාදන ක්‍රියාවලියේදී කැපකරනු ලබන සියලුම ආර්ථික සම්පත්වල ආවස්ථික පිරිවැයයි.

නිෂ්පාදන පිරිවැය පහත පරිදි වර්ග කළ හැක.

- ස්ථාවර
- විචල්‍ය

- සෘජු
- වක්‍ර

JMC vLearning
"your virtual learning partner"



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

| සෘජු පිරිවැය | වක්‍ර පිරිවැය |
| --- | --- |
| නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ආයතනය විසින් පිටතින් මිලදී ගත් යෙදවුම් සඳහා ගෙවන ලද මුදල් ප්‍රමාණයයි.<br><br>උදා - | නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා උපයෝගී කරගනු ලබන ආයතනය සතු නිෂ්පාදන සම්පත් වල ආවස්ථික පිරිවැයයි<br><br>උදා - |

නිෂ්පාදන පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

ආර්ථික පිරිවැය = නිෂ්පාදන පිරිවැය = ආවස්ථික පිරිවැය

**ආර්ථික පිරිවැය හා ගණකාධිකරණ පිරිවැය අතර වෙනස**

ගණකාධිකරණ පිරිවැය = සෘජු පිරිවැය

ආර්ථික පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972
JMC vLearning "your virtual learning partner"

## ආර්ථික ලාභය හා ගණකාධිකරණ ලාභය අතර වෙනස

| |
|---|
| ගණකාධිකරණ ලාභය = |

| |
|---|
| ආර්ථික ලාභය = |

# Question book

- example question

## කෙටි කාලය හා දිගු කාලය

❖ කෙටි කාලය

- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගැනෙන ඇතැම් යෙදවුම් (අවම වශයෙන් එක් සාධකයක්වත්) වෙනස් කළ නොහැකි කාලපරිච්ඡේදය කෙටි කාලය නම් වේ.

- මේ නිසා කෙටි කාලයේදී ස්ථාවර යෙදවුම් හා විචල්‍ය යෙදවුම් ලෙසින් සාධක දෙවර්ගයක් දැකිය හැකිය.

JMC vLearning "your virtual learning partner"



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

කර්මාන්තශාලාවේ තාක්ෂණය හා ධාරිතාව නොවෙනස්ව තිබියදී විචල්‍ය යෙදවුම් වෙනස් කරන විට යෙදවුම් හා නිමවුම් අතර පවත්නා තාක්ෂණික සම්බන්ධතාව කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය නමින් හැඳින්වේ.

- කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය

- කෙටි කාලයේදී වෙනස් කළ හැක්කේ විචල්‍ය සාධක පමණක් බැවින්

- ශ්‍රමය වෙනස් කළ හැකි සාධකය යන අර්ථයෙන්

❖ දිගු කාලය

නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ සියලුම යෙදවුම් වෙනස් කිරීමට ප්‍රමාණවත් කාලය දිගු කාලයයි. මේ නිසාම නිෂ්පාදන ක්‍රියාවලියක දිගුකාලයේ පවතින සියලුම යෙදවුම් විචල්‍ය යෙදවුම් වේ. දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ ශ්‍රිතය පහතින් දැක්වේ.

නිෂ්පාදන ක්‍රියාවලිය අදියර 02 කට වෙන් කළ හැකිය.

- ......................................................................................................................
- ......................................................................................................................



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## කෙටි කාලීන නිෂ්පාදන ඵලදා සංකල්ප

කෙටි කාලයේ දී ස්ථාවර යෙදවුම් සමග විචල්‍ය යෙදවුම් පමණක් වැඩි කිරිමේ දී නිෂ්පාදන ස්වරූප තුනක් නිෂ්පාදන ක්‍රියාවලිය තුළදී හඳුනාගත හැකිය.

- මුළු නිෂ්පාදිතය (TP)
  විචල්‍ය යෙදවුම්, ස්ථාවර යෙදවුම් සමග මිශ්‍ර කරමින් නිෂ්පාදනය සිදු කිරීමෙන් ලබන ප්‍රතිඵලය මුළු නිෂ්පාදිතයයි.

- සාමාන්‍ය නිෂ්පාදිතය (AP)
  විචල්‍ය යෙදවුම් ඒකකයකට සාමාන්‍යයෙන් ලැබෙන නිමවුම් ඒකක ප්‍රමාණය සාමාන්‍ය නිෂ්පාදිතය නම් වේ.

.

ආන්තික නිෂ්පාදිතය (MP)

විචල්‍ය යෙදවුම් එක් ඒකකයකින් වෙනස් කිරීම තුළින් මුළු නිෂ්පාදිතයේ හට ගන්නා වෙනස් වීම ආන්තික නිෂ්පාදිතය නම් වේ.




JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC vLearning "your virtual learning partner"

| විචල්‍ය සාධකය | මුළු නිෂ්පාදිතය | ආන්තික නිෂ්පාදිතය | සාමාන්‍ය නිෂ්පාදිතය |
|---|---|---|---|
| 0 | 0 | | |
| | > | | |
| 1 | 6 | | |
| | > | | |
| 2 | 20 | | |
| | > | | |
| 3 | 48 | | |
| | > | | |
| 4 | 72 | | |
| | > | | |
| 5 | 80 | | |
| | > | | |
| 6 | 84 | | |
| | > | | |
| 7 | 84 | | |
| | > | | |
| 8 | 80 | | |

JMC vLearning
"your virtual learning partner"





JMC vLearning
"your virtual learning partner"



JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## හීනවන ඵලදා නීතිය

කෙටි කාලය තුළ නිරත වන නිෂ්පාදන ආයතන විසින් විචල්‍ය යෙදවුම් සහ ස්ථාවර යෙදවුම් යන දෙවර්ගයම භාවිතා කරන අතර ස්ථාවර සාධක නොවෙනස්ව තබා ගනිමින් විචල්‍ය යෙදවුම් පමණක් වැඩි කරමින් නිෂ්පාදනයේ නිරත වේ. එහිදී නිමවුම කිසියම් රටාවකට අනුව හැසිරෙන අතර එම හැසිරීම 'හීනවන ආන්තික ඵලදා නීතිය' මගින් පෙන්නුම් කෙරේ.

නිෂ්පාදන ආයතන විසින් කෙටි කාලයේ දී ස්ථාවර යෙදවුම් සමග මිශ්‍ර කරමින් විචල්‍ය යෙදවුම් පමණක් වැඩි කරන විට විචල්‍ය යෙදවුමේ ආන්තික ඵලදාව හා සාමාන්‍ය ඵලදාව එක්තරා අවස්ථාවකට පසුව පහළ යෑම

හීනවන ආන්තික ඵලදා නීතිය නම් වේ.

හීන වන ආන්තික ඵලදා නීතිය පහත දැක්වෙන උපකල්පන මත පදනම්ව සකස් වී ඇත.

1. සියලු විචල්‍ය ඒකක සමජාතීය වීම
2. අදාළ නිෂ්පාදන ක්‍රියාවලිය තුළ තාක්ෂණය නොවෙනස්ව පැවතීම

උදා:- අක්කරයක ඉඩමක තේ වගා කිරීම සඳහා ශ්‍රමිකයන් යෙදවීම

ස්ථාවර සාධක - ඉඩම, විචල්‍ය සාධක - ශ්‍රමිකයන්

JMC vLearning "your virtual learning partner"



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

මෙහි විචල්‍ය සාධක ප්‍රමාණය වැඩි කිරීමත් සමග ස්ථාවර සාධක ප්‍රමාණය විචල්‍ය සාධක ප්‍රමාණය අතර බෙදී යන හෙයින් විචල්‍ය සාධක ඒකකයකට ලැබෙන ස්ථාවර සාධක ප්‍රමාණය ක්‍රමයෙන් අඩු වේ. ඉඩමෙහි තේ වගා කිරීමට අඩුවෙන් ශ්‍රමය යොදවන විට ශ්‍රමය වැඩි කරන ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් නිමවුම වැඩි කර ගැනීමට හැකියාව ලැබේ. එහෙත් අක්කරයකට යොදවන ශ්‍රම ප්‍රමාණය සීමාව ඉක්මවා යන පරිදි වැඩි කරන විට ලැබෙන තේ අස්වනු ප්‍රමාණය ශ්‍රමය වැඩි කරන ප්‍රතිශතය මෙන් වැඩි නොවේ. අනෙක් අතට එක් එක් ශ්‍රමිකයෙකු බැගින් වැඩි කිරීමෙන් මුළු නිමවුමට අලුතෙන් එකතු වන ප්‍රමාණයත් ක්‍රමයෙන් අඩු වී එන ශූන්‍ය මට්ටමක් කරා ළඟා වීමට පුළුවන.

පහත ප්‍රස්ථාර සටහනට අනුව,

- මුළු නිෂ්පාදිතය මුලදී වේගයෙන් ඉහළ ගොස් පසුව ක්‍රමයෙන් වර්ධන වේගය පසු බසින ප්‍රවණතාවකට මුහුණ දේ.

- විචල්‍ය යෙදවුම් තව දුරටත් වැඩි කරනු ලැබුවහොත් එක්තරා අවස්ථාවකදී මුළු නිෂ්පාදිතය උපරිම වී පසුව පහත වැටීමට ද ඉඩ ඇත.

- නිෂ්පාදිතයේ හැසිරීම අවධි තුනකි. එනම් මුළු නිෂ්පාදිතය මුල දී වැඩි වන වේගයෙන් ඉහල ගොස් පසුව අඩු වන වේගයෙන් ඉහළ ගොස් නැවත නිමවුම පහළ බසී.

- මුළු නිෂ්පාදිතය වේගයෙන් ඉහළ නගින විට ආන්තික නිෂ්පාදිතය උපරිම වන අතර මුළු නිමවුමේ වේගය අඩු වීමේ දී ආන්තික නිෂ්පාදිත වක්‍රය සාමාන්‍ය නිෂ්පාදිත වක්‍රයේ උපරිම ලක්ෂ්‍යය ඡේදනය කරමින් වේගයෙන් පහතට ගමන් කරයි. එහිදී සාමාන්‍ය ඵලදාව උපරිම වේ. මුළු ඵලදාව උපරිම වන විට ආන්තික ඵලදාව ශූන්‍ය වේ.

- විචල්‍ය යෙදවුම් වැඩි කරන විට දී ස්ථාවර යෙදවුම් ද වැඩි කිරීමට හැකි නම් ආන්තික ඵලදාව හීන වීම වළක්වා ගත හැකිය. නමුත් කෙටි කාලයේදී ස්ථාවර යෙදවුම් වැඩි කළ නොහැකිය.


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය

කෙටි කාලයේ දී නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදී සිටින නිෂ්පාදන ආයතන විසින් විචල්‍ය යෙදවුම් හා ස්ථාවර යෙදවුම් යන දෙවර්ගයම භාවිතා කෙරේ. කෙටි කාලයේ දී නිෂ්පාදන ආයතන ස්ථාවර සාධක නොවෙනස්ව තබා ගනිමින් විචල්‍ය යෙදවුම් පමණක් වැඩි කරමින් නිෂ්පාදනයේ යෙදේ. ස්ථාවර සාධක නොවෙනස්ව තබා ගෙන විචල්‍ය යෙදවුම් පමණක් වැඩි කරමින් නිෂ්පාදනය වැඩි කිරිමේදී නිමවුම කිසියම් රටාවක් අනුව හැසිරේ.

### කෙටි කාලීන නිෂ්පාදන පිරිවැය සංකල්ප

කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය තුල විචල්‍ය සාධක හා ස්ථාවර සාධක ලෙස වර්ග දෙකක් පවතී. එනම් මුළු ස්ථාවර පිරිවැය සහ මුළු විචල්‍ය පිරිවැයයි. මෙම පිරිවැයන් 02හි එකතුව කෙටිකාලීන මුළු පිරිවැය ලෙස හැඳින්වේ. කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය තුළ පහත දැක්වෙන පිරිවැය සංකල්පයන් ද හඳුනා ගත හැකිය.

- ..............................................................................
- ..............................................................................
- ..............................................................................
- ..............................................................................

- සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC)

නිමවුම් ඒකකයකට දරන ස්ථාවර පිරිවැය සාමාන්‍ය ස්ථාවර පිරිවැය ලෙස හැඳින්වේ. මුළු ස්ථාවර පිරිවැය නිමවුම් ඒකක ප්‍රමාණයෙන් බෙදීමෙන් සාමාන්‍ය ස්ථාවර පිරිවැය ලබා ගත හැකිය.

JMC vLearning "your virtual learning partner"


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

- සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC)

නිමවුම් ඒකකයකට දරන විචල්‍ය පිරිවැය සාමාන්‍ය විචල්‍ය පිරිවැය ලෙස හැඳින්වේ. මුළු විචල්‍ය පිරිවැය නිමවුම් ඒකක ප්‍රමාණයෙන් බෙදීමෙන් සාමාන්‍ය විචල්‍ය පිරිවැය ලබාගත හැකිය. සාමාන්‍ය විචල්‍ය පිරිවැය දළ ඉංග්‍රීසි යූ (U) අකුරක හැඩය ගනු ලැබේ.

- සාමාන්‍ය මුළු පිරිවැය (AC)

නිමවුම් ඒකකයකට දරණ මුළු පිරිවැය සාමාන්‍ය මුළු පිරිවැය ලෙස හැඳින්වේ. මුළු පිරිවැය නිමවුම් ඒකක ප්‍රමාණයෙන් බෙදීමෙන් සාමාන්‍ය මුළු පිරිවැය ලබා ගත හැකිය. නිමවුම වැඩි කරන විට සාමාන්‍ය මුළු පිරිවැය ක්‍රමයෙන් අඩු වී නැවත ඉහළ යයි. සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය දළ ඉංග්‍රීසි යූ (U) අකුරක හැඩය ගනු ලැබේ.

- ආන්තික පිරිවැය (MC)

ආන්තික පිරිවැය යනු නිමවුම එක් ඒකකයකින් වෙනස් කරන විට මුළු පිරිවැය වෙනස් වන ප්‍රමාණයයි. මුළු පිරිවැයේ වෙනස නිමවුමේ වෙනසින් බෙදූ විට ආන්තික පිරිවැය ලැබේ.


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972





**Fig. 1 : Short run Average and Marginal Cost Curves**

JMC vLearning
"your virtual learning partner"



JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## දිගුකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය

දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ දී සියලුම යෙදවුම් විචල්‍යය යෙදවුම් වේ. නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා බලපානු ලබන කිසිදු සාධකයක් දිගු කාලයේදී දක්නට නොලැබේ. ඒ අනුව දිගු කාලයේ දී සියලුම නිෂ්පාදන ආයතන වඩා නම්‍යශිලි තත්වයකට පත් වේ. එමෙන්ම තම නිෂ්පාදන ප්‍රමාණය කැමති පරිදි වෙනස් කර ගැනීමට ආයතන වලට හැකියාව ඇත.

දිගු කාලයේ දී නිෂ්පාදන ධාරිතාව ප්‍රසාරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පරිමාණානුකූල පිරිමැසුම් හා පරිමාණානුකූල නොපිරිමැසුම් බිහි වේ.

- පරිමාණානුකූල නොපිරිමැසුම් පවතින විට
- පරිමාණානුකූල පිරිමැසුම් පවතින විට
- පරිමාණානුකූල නොපිරිමැසුම් හෝ පිරිමැසුම් නොපවතින විට

- පරිමාණානුකූල පිරිමැසුම් යනු දිගු කාලයේ දී නිෂ්පාදන ආයතනයක් නිෂ්පාදන ප්‍රසාරණය කිරීමේ දී ආයතනයේ සාමාන්‍ය පිරිවැය පහළ බැසීමයි. ඒ අනුව ආයතනයේ ධාරිතාව පුළුල් කිරීමත් සමගම නිෂ්පාදන සාධක වල කාර්යක්ෂමතාව ඉහළ යෑමත්, නිෂ්පාදන යෙදවුම් වල මිල පහළ වැටීමත් නිසා අත්පත් කර ගත හැකි මූල්‍ය ප්‍රතිලාභයක් ලෙස පරිමාණානුකූල පිරිමැසුම් හැඳින්විය හැකිය.

- පරිමාණානුකූල නොපිරිමැසුම් යනු දිගු කාලයේ දී ආයතනයක් නිෂ්පාදන ප්‍රසාරණය කිරිමේ දී ආයතනයේ සාමාන්‍ය පිරිවැය හෙවත් ඒකක පිරිවැය ඉහළ යාමයි. එනම් ආයතනයක ධාරිතාව පුළුල් කිරිමත් සමගම නිෂ්පාදන සාධකවල කාර්යක්ෂමතාව පහළ යෑම නිසා මූල්‍යමය වශයෙන් සිදු වන අලාභය යි.


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

පරිමාණානුකූල නොපිරිමැසුම් වලට හා නොපිරිමසුම් වලට මුහුණ දෙන නිෂ්පාදන ආයතනයක දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය ඉංග්‍රීසි U අකුරක හැඩය ගනී.



## පරිමාණානුකූල ඵල නීතිය

දිගු කාලයේ දී සියලුම යෙදවුම් වෙනස් කරමින් නිෂ්පාදනයේ යෙදීමට නිෂ්පාදන ආයතනයට හැකිය. සියලුම යෙදවුම් විචල්‍ය යෙදවුම් වන විට නිමවුම හැසිරෙන ආකාරය පරිමාණානුකූල ඵල නීතිය යනුවෙන් අදහස් වේ.

දිගු කාලයේ දී තම නිෂ්පාදන ආයතනයේ සමස්ත පරිමාව වෙනස් කිරීමට නිෂ්පාදන ආයතනයට හැකි ය. පරිමාණානුකූල ඵල ආකාර 03කි,

- වැඩි වන පරිමාණානුකූල ඵල
- 
- 

JMC vLearning
"your virtual learning partner"

පරිමාණානුකූල ඵල ආයතනයක ධාරිතාව පුළුල් කිරීමත් සමග නිෂ්පාදන සාධක වල කාර්යක්ෂමතාව ඉහළ යෑමෙන් අත්පත් කර ගනු ලබන මූර් ත ප්‍රතිලාභ වේ.

- වැඩිවන පරිමාණානුකූල ඵල

  සියලුම යෙදවුම් වෙනස් කරන ප්‍රතිශතයට වඩා විශාල ප්‍රතිශතයකින් නිමවුම වැඩිවීම වැඩිවන පරිමාණානුකූල ඵල යනෙන් අදහස් වේ.

  උදා- යෙදවුම් 20% කින් වැඩි කරන විට, නිමවුම 50% කින් වර්ධනය වීම

○ වැඩිවන පමානුකූල ඵල හට ගැනීමට බලපාන සාධක

- නිෂපාදන සාධක වල අභජ්‍යතාවය හෙවත් නොබෙදිය හැකි යෙදවුම තිබිම
- ශ්‍රම විභජනය මගින් විශේෂ ප්‍රාගුණ්‍ය කිරීමේ හැකියාව
- යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීමේ හැකියාව
- එක් වරක දී පමණක් දැරිය යුතු වියදම් තිබීම

- අඩුවන පරිමාණානුකූල ඵල

  යෙදවුම් වැඩි කරන ප්‍රතිශතයට වඩා අඩු ප්‍රතිශතයකින් නිමවුම වැඩි වීම අඩු වන පරිමාණානුකූල ඵලයි.

  උදා - යෙදවුම් 20% කින් වැඩි කරන විට, නිමවුම 15% කින් වර්ධනය වීම

○ අඩුවන පමාණානුකූල ඵල හට ගැනීමට බලපාන සාධක

- සම්පත් හීන වීම (සම්පත් ක්ෂය වීම)
- ආතතිය
- කළමණාකරණය හා සම්බන්ධිකරණය පිළිබඳ ගැටලු ඇති වීම

- ස්ථාවර පරිමාණානුකූල ඵල

  යෙදවුම් වැඩි කරන ප්‍රතිශතයට සමාන ප්‍රතිශතයකින් නිමවුම වැඩි වීම ස්ථාවර පරිමාණානුකූල ඵලයි.

  උදා - යෙදවුම් 20% කින් වැඩි කරන විට, නිමවුම 20% කින් වැඩි වීම

JMC vLearning "your virtual learning partner"



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## වෙළඳපොළ ව්‍යුහයන් වල ලක්ෂණ

ආයතන වලින් නිපදවනු ලබන භාණ්ඩ හා සේවා විවිධ වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ අලෙවි කරන අතර එම වෙළෙදපොළ තත්වයන් හැඳින්වීමට වෙළෙඳපොළ ව්‍යුහය යන සංකල්පය යොදා ගැනේ. එක් එක් වෙළෙඳපොළ ව්‍යුහයන් එකිනෙකට වෙනස් වීමට පහත සඳහන් සාධක බලපානු ලැබේ. එනම්,

- වෙළෙඳපොළ තුළ සිටින ආයතන සංඛ්‍යාව
- නිෂ්පාදිතයේ සමජාතීය බව
- ආයතනයකට වෙළෙඳපොළට පිවිසීමට හා ඉවත් වීමට ඇති හැකියාව
- වෙළෙඳපොළ තුළ සිටින නිෂ්පාදන ආයතන අතර පවත්නා තරඟයෙහි ස්වභාවය

- වෙළඳ පොළ ව්‍යුහයන් පහත පදිරි දැක්විය හැකිය




JMC vLearning
"your virtual learning partner"

## පූර්ණ තරගය

පූර්ණ තරගකාරී වෙළෙඳ පොළ ව්‍යුහය පහත දැක්වෙන ලක්ෂණ වලින් සමන්විත වේ.

- සමජාතීය භාණ්ඩ නිපදවීම - වෙළඳපොළ තුළ සිටින සියලුම ආයතන එක හා සමාන ආදේශක වූ භාණ්ඩ නිපදවීම සිදු කෙරේ.

- ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් සංඛ්‍යාව විශාල වීම - වෙළඳපොළ තුළ ගැණුම්කරුවන් සහ විකුණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටින බැවින් එක් ආයෙකුගේ ක්‍රියාවන් පිළිබිඹු නොවේ.

- ආයතනය මිල ගනුවකු වීම - වෙළඳපොළ ඉල්ලුම හා සැපයුමට බලපෑම් කිරිමට ගැනුම්කරුවකුට හෝ විකුණුම්කරුවකුට නොහැකිය. එබැවින් වෙළඳ පොළ මගින් තීරණය වන මිල යටතේ සැපයීමට ආයතනයට සිදු වේ. එසේ වන්නේ වෙළෙඳ පොළේ සිටින සෑම ආයතනයක්ම සුළු ප්‍රමාණයක් යටතේ සමජාතීය භාණ්ඩ නිෂ්පාදනය කිරීම හේතුවෙනි. එබැවින් පූර් ණ තරගකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය තිරස් අක්ෂයට සමාන්තර වූ සරල රේඛාවක් ලෙස පිහිටයි.

- ආබාධ පිවිසුම හා පිටවීම - කර්මාන්තයේ සිටින ආයතන වලට නිෂ්පාදන කටයුතු වලට පිවිසීමට හෝ ඉන් ඉවත් වීමට කිසිදු බාධාවක් නොමැත.

- ගැනුම්කරුවන් හා විකුණුම් කරුවන්ට වෙළඳපොළ පිලිබඳ තොරතුරු පූර්ණ වශයෙන් හා පිරිවැයකින් තොරව ලබා ගත හැකි වීම

- සාධක සංචලතවයට බාධා නොවීම - කර්මාන්ත අතරේ සාධක හුවමාරු වීමට ඇති හැකියාවයි

- දිගු කාලීන සමතුලිතයේ දී වෙළඳ පොළ තුළ සිටින සියලුම ආයතන ප්‍රාමාණික ලාභ පමණක් ලැබීම.


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## ඒකාධිකාරය

තනි විකුණුම්කරුවකු සිටින වෙළඳපොළක් ඒකාධිකාරි වෙළඳ පොළක් ලෙස හැඳින් වේ. ඒකාධිකාරි වෙළෙඳ පොළක ලක්ෂණ පහත පරිදි දැක්විය හැකිය.

- ප්‍රවේශයට බාධා පැවතීම - ආයතනයකට ඒකාධිකාරී කර් මාන්තයකට ඇතුළු වීම ඉතා දුෂ්කර වේ.

- නිෂ්පාදනය සුවිශේෂ වීම - අදාළ නිෂ්පාදිතය ලබා ගත හැකි වන්නේ එකම නිෂ්පාදකයෙකුගෙන් පමණක් වන අතර මේ මගින් වෙළෙඳපොළ තුළ නිෂ්පාදකයාට ඒකාධිකාරී බලයක් හිමි වේ.

- එක් ආයතනයක් පමණක් නිෂ්පාදනයේ නිරත වීම - ඒකාධිකාර වෙළෙඳපොළක් තුළ එකම ආයතනයක් පමණක් සිටින බැවින් තරගයක් දක්නට නොමැති අතර ඒ නිසාම ඒකාධිකාරී බලයකින් කටයුතු කිරීමට ආයතනයකට හැකියාව ලැබේ.

- වෙළෙඳපොළ තොරතුරු අපූර්ණ වීම හා පිරිවැයකින් තොරව ලබා ගත නොහැකි වීම.

- මිල අඩු වැඩි කිරීමට ඇති හැකියාව නිසා ඒකාධිකාරී වෙළෙඳපොළක ආයතනයක් මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළට බෑවුම් වේ.

  ❖ ඒකාධිකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය

- ඒකාධිකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය එම කර්මාන්තයේද ඉල්ලුම් වක්‍රයට සමාන වේ. එය වමේ සිට දකුණට පහළට බෑවුම් වන එකකි.

- පූර්ණ තරඟකාරි ආයතනයක එකම මිලක් යටතේ අලෙවිය වැඩිකර ගත හැකි බැවින් ආන්තික අයභාර වක්‍රය (MR) අදාළ මිල යටතේ තිරස් අක්ෂයට සමාන්තරව ඇඳිය හැකිය. එහෙත් ඒකාධිකාර ආයතනයක් නිෂ්පාදනය කරන භාණ්ඩයේ අලෙවිය වැඩිකර ගැනීමට මිල අඩුකළ යුතු නිසා, ආන්තික අයභාරය ක්‍රමයෙන් අඩුවේ. එමනිසා ආන්තික අයභාරය සාමාන්‍ය අයභාරයට වඩා අඩු අගයක් ගනී.



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## ඒකාධිකාරි තරඟය

පූර්ණ තරගයෙහි සහ ඒකාධිකාරයෙහි සංකලනයක් ලෙස ඒකාධිකාරි තරගය හැඳින්විය හැකිය. ඒකාධිකාරි වෙළෙඳ පොළක පහත සඳහන් ලක්ෂණ දැකිය හැකි වේ.

- වෙළඳපොළ තුළ ආයතන විශාල සංඛ්‍යාවක් තිබීම

  වෙළඳපොළ තුළ ආයතන විශාල සංඛ්‍යාවක් සිටින අතර එක් එක් ආයතන ස්වාධීන මිල ප්‍රතිපත්ති අනුගමනය කරයි. ආයතන විශාල සංඛ්‍යාවක් ඇති බැවින් එක් ආයතනයකට මුළු වෙළෙඳ පොළ තුලින් හිමි වන්නේ ඉතා කුඩා කොටසකි. එබැවින් එක් ආයතනයක නිෂ්පාදනයට අන් ආයතන කෙරෙහි කිසිදු බලපෑමක් සිදු කළ නොහැක.

- එක් එක් ආයතනය ප්‍රභේදනය කළ භාණ්ඩ නිෂ්පාදනය කිරීම

  වෙළඳපොළ තුළ සිටින සියලුම ආයතන එකම භාණ්ඩය නිෂ්පාදනය කළද එක් එක් ආයතනයේ නිෂ්පාදිත අතර විවිධ වෙනස්කම් පවතී. එබැවින් ඒකාධිකාරි තරඟ ආයතන නිපදවන භාණ්ඩ සමජාතීය නොවන අතර එක් භාණ්ඩයක් තවත් භාණ්ඩයක් සඳහා පූර් ණ ආදේශන නොවේ.

- වෙළඳපොළ  තුළට ප්‍රවේශ වීමට හෝ පිට වීමට බාධා නොමැති වීම
- ආයතනය මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වීම.
- සාධක සංචලතාවට බාධා නොපැවතීම.
- ඒකාධිකාරි තරගකාරී ආයතන දිගු කාලයේ දී ප්‍රාමාණික ලාභ පමණක් ලැබීම

  ඒකාධිකාරි තරගකාරි ආයතනයක් කෙටි කාලයේ දී අති ප්‍රමාණික ලාභ ඉපයීමට ඉඩකඩ පවතින අතර මේ නිසා නව ආයතන වෙළඳපොළ තුළට ප්‍රවේශ වේ. මේ නිසා දිගු කාලයේ දී ඒකාධිකාරි තරගකාරි ආයතනයකට ලැබිය හැක්කේ ප්‍රාමාණික ලාභ පමණි.

## කතිපයාධිකාරය

මුළු වෙළෙඳපොළම නිෂ්පාදන ආයතන අතලොස්සකට පමණක් හිමිව පවතින වෙළඳ පොළ තත්වය කතිපයාධිකාරය ලෙස හැඳින්වේ. කතිපයාධිකාර වෙළෙඳපොළක ලක්ෂණ පහත පරිදි දැක්විය හැකිය.

- සැපයුම්කරුවන් සංඛ්‍යාව අතිශයින් සීමිත වීම.
- ප්‍රවේශයට බාධා පැවතීම.
- ආයතන අතර දැඩි අන්‍යෝන්‍ය බැඳියාවක් පැවතීම.
- ප්‍රභේදනය වූ හෝ ප්‍රභේදනය නොවූ හෝ භාණ්ඩ නිපදවීම.
- ආයතන මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය සාපේක්ෂ වශයෙන් අනම්‍ය වූ පහළට බෑවුම් වන එකක්වීම



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## ආන්තික පිරිවැය, ආන්තික අයභාරය හා ලාභය උපරිම කිරීම

### ආන්තික පිරිවැය


### ආන්තික අයභාරය

නිමැවුම එක් ඒකකයකින් වැඩි කරන විට මුළු අයභාරයට අලුතින් එකතු වන ප්‍රමාණය ආන්තික අයභාරය ලෙස හැඳින්වේ.

### ප්‍රශස්ත නිමැවුම

- යම් අවස්ථාවක ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වන අවස්ථාව ප්‍රශස්ත නිමැවුම ලෙස හැඳින්වේ.

  ලාභ උපරිම කරන ප්‍රශස්ත නිමැවුම පහත ප්‍රස්ථාරය මඟින් පෙන්නුම් කළ හැක.



JMC vLearning
"your virtual learning partner"



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

පූර්ණ තරඟකාරී ආයතනයක කෙටි කාලීන හැසිරීම තුළ මුහුණ දිය හැකි විකල්ප අවස්ථා කිහිපයකි.

- ආර්ථික ලාභ ඉපයීම (නිශ්ප්‍රාමාණික/ අතිප්‍රාමාණික ලාභ)

## ආර්ථික ලාභ උපයමින් නිෂ්පාදනයේ යෙදී සිටීම

පහත රූප සටහනට අනුව පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක් ආර්ථික ලාභ උපයමින් නිෂ්පාදනයේ යෙදී සිටින අවස්ථාවේදී මිල සාමාන්‍ය පිරිවැය ඉක්මවා යන අතර මුළු අයභාරය මුළු පිරිවැය ඉක්මවා යනු ඇත.



## ආර්ථික ලාභ ශුන්‍ය මට්ටමේදී නිෂ්පාදනයේ යෙදීම.

පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක් ප්‍රමාණික ලාභ ලබන අවස්ථාවේදී මිල සාමාන්‍ය පිරිවැයට සමාන වන අතර මුළු අයභාරයද මුළු පිරිවැයට සමාන වේ.



## අවප්‍රාමාණික ලාභ

පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක භාණ්ඩ ඒකකයක සාමාන්‍ය පිරිවැය භාණ්ඩ ඒකකයක මිල ඉක්මවා යන අවස්ථාවේදී පාඩු ලැබීම සිදුවේ. මෙහිදී මුළු අයභාරයට වඩා මුළු පිරිවැය වැඩි වන හෙයින් අවප්‍රාමාණික ලාභ හිමිවේ.



JMC vLearning
"your virtual learning partner"

## පූර්ණ තරඟකාරී වෙළඳපොළක දිගු කාලීන සමතුලිතය

පුර්ණ තරඟකාරී වෙළඳපොළක දිගුකාලීන සමතුලිතය තීරණය කරන ප්‍රධාන සාධකය වන්නේ, වෙළඳපොළට පිවිසීමටත් ඉන් පිටව යාමටත් ඇති හැකියාවයි. කෙටි කාලීන සමතුලිතයේදී, ආයතන වන විවිධ ආර්ථික ලාභ මට්ටම් පැවතිය හැකිය. එවැනි ආර්ථික ලාභ හා අලාභ වෙළඳපොළට පිවිසෙන්නන්ට හා පිටව යන්නන්ට සංඥා සපයයි.

කෙටි කාලීන සමතුලිතයේදී ආයතනයක් ආර්ථික ලාභ ලබයි නම්, එය අලුතින් වෙළඳපොළට පිවිසීමට පෙළඹවීමක් කරනු ඇත. එහි ප්‍රතිඵලය වෙළඳපොළ සැපයුම ඉහළ යාම වන අතර සමතුලිත මිල පහළයාමට තුඩු දේ. ඒ නිසා ආර්ථික ලාභ පහළ වැටෙන අතර, ආර්ථික ලාභ ශූන්‍ය (ප්‍රාමාණික ලාභ ලබන අවස්ථාව) වන තුරු අලුත් ආයතන වෙළඳපොළට එක් වේ.



